**සමන්තුරෙයි ප්‍රාදේශීය සභාව - 2021**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

සමන්තුරෙයි ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට සමන්තුරෙයි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**--------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

**-----------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍යයන් සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ සහ 2019 වර්ෂයේදි කාර්යයන් අවසන් කර තිබූ ඉදිකිරීම් 07ක වටිනාකම් එකතුව රු.7,142,127ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිරි මූල්‍ය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) 2013 වර්ෂයේදි සමාජ වගකීම් (Social Resposibility) පදනමින්, ප්‍රජා සංවිධානයක මායිම් බිත්තිය බැදීම සඳහා වැයකළ රු.140,902ක වටිනාකම ප්‍රාග්ධනිත කර තිබුණි. | - එම - | - එම - |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු මුද්දර ගාස්තු රු.4,820,400ක් ආදායම් ණයගැතියන් ලෙස ඉදිරියට ගෙනැවිත් නොතිබුණි. | - එම - | - එම - |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.23,642,420 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.8,394,875ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **වරිපනම් හා බදු**<br>සමාලෝචිත වර්ෂය තුළ බිල් කළ ආදායම රු.6,338,748 ක් වූ අතර ඉන් වර්ෂය තුළ රැස්කළ ආදායම රු.1,495,650 ක් විය. වර්ෂය අවසාන දිනට හිඟහිටි ශේෂය රු.22,883,530 ක් පැවතුණෙන් වරිපනම් හා බදු අය කිරීම දුර්වල මට්ටමක පැවතිණි. | බදු අයකිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | ආදායම් කඩිනමින් අයකිරීමට පියවර ගත යුතුය |

**(ආ) කුලී**

--------

| | | |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට අයකළ යුතු හිඟ කඩකුලී රු.2,291,338කින් සියයට 80ක් හෙවත් රු. 1,845,204ක් වර්ෂ 5 සිට 10ක් දක්වා පරාසයක කාලයක සිට කුලී හිමියන් 95ක ගෙන් අයකළ යුතුව තිබුණි. එසේම, වර්ෂ 10කට අධික කාලයක සිට අයකළ යුතුව තිබූ හිඟහට් වටිනාකම රු.135,016ක් විය. | කඩකුලී අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. | කඩකුලී අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

**(ඇ) බදුකුලී**

---------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලංසු මත බදු දීමෙන් ලැබිය යුතු හිඟ බදුකුලී රු.7,920,448ක් විය. ඉන් වර්ෂ 1ත් 05ත් අතර කාල පරාසයකට අයත් රු.5,150,088ක් බදුහිමියන් 23කගෙන් අයකළ යුතුව තිබූ අතර වර්ෂ 5කට අධික කාලයක සිට හිඟහිටිව පැවැතුණු රු.2,650,300ක් බදුහිමියන් 16කගෙන් අය කළයුතුව තිබුණි. | බදුහිමියන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන අධිකරණය මාර්ගයෙන් හිඟමුදල් අයකරමින් පවතී. | බදුකුලී අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

**(ඈ) මුද්දර ගාස්තු**

----------------

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ මුද්දර ගාස්තු රු.4,820,400 ක් විය. | අයකළ යුතු මුද්දර ගාස්තු ලබා ගැනීමට කටයුතු කර ඇත. | ආදායම් කඩිනමින් අයකිරීමට පියවර ගත යුතුය |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභා බලප්‍රදේශයේ පිහිටි නිශ්චල දේපළ 578ක විකුණුම් වටිනාකම වන රු.153,885,000 කින් සියයට එකක ගාස්තු අයකිරීමට ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව ක්‍රියාමාර්ග ගෙන | ඉහත කරුණ සම්බන්ධයෙන් ඉදිරි අනාගතයේදි ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව දේපළ විකුණුම් වටිනාකමින් සියයට එකක ගාස්තුවක් අයකිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි. මේ හේතුවෙන් සභාවට රු.1,538,850ක ආදායමක් අහිමි වී තිබුණි. | | |
| (ආ) | 1993 නොවැම්බර් 10 දිනැති අංක 15 දරන නාගරික සංවර්ධන අධිකාරියේ චක්‍රලේඛය ප්‍රකාරව, සභාව විසින් පවත්වාගෙන යනු ලබන නාගරික සංවර්ධන අධිකාරියේ බැංකු ගිණුමේ ශේෂ ආපසු ලබා ගැනීමේදී ශක්‍යතා වාර්තා සමග වූ ව්‍යාපෘති ඉදිරිපත් කර නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධානියාගේ හෝ අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ පූර්ව අනුමැතිය සහිතව ආපසු ලබාගත යුතු වුවද, මෙයට පටහැනිව, සමාලෝචිත වර්ෂයේ රු.334,680ක් සභාවේ ගිණුමට බැරකර තිබුණි. | අදාල කරුණ පිළිබඳව නාගරික සංවර්ධන අධිකාරියේ උපදෙස් විමසා ඇත. | බැංකු ගිණුමේ ඇති ශේෂ ආපසු ලබා ගැනීමට ශක්‍යතා වාර්තා සමග වූ ව්‍යාපෘති ඉදිරිපත් කර නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධානියාගේ හෝ අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ පූර්ව අනුමැතිය සහිතව ආපසු ලබාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභාව සතු සහ සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන ඉඩම් 50 ක හා වාහන 37 ක වටිනාකම තක්සේරු කර ගිණුම් ගතකර නොතිබුණු අතර සමාලෝචිත වසර අවසාන වන විටත් ඒවා තක්සේරු කිරීමට අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වටිනාකම් තක්සේරු කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. | වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීම කඩිනම් කළයුතු වේ. |